සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 03

I පත්‍රය

කාලය පැය 01 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **40** ක් ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	V/I/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/I/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	V/I/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/I/S/CH

ලබා දෙන දිනය - 2026.05.14 පෙ.ව. 11.15 සිට ප.ව. 12.15 /දෙවැනි පිටුව බලන්න.

01. පහත කළ හතරක රූප පහක් A, B, C, D, E මඟින් දැක්වේ. ඒවා අතරින් එක ම කළය දැක්වෙන රූප දෙක මොනවා ද?



A B C D E

(1) A සහ D (2) B සහ D (3) C සහ E

02. මුලින් දී ඇති රූපය සකස් කිරීම සඳහා A, B, C, D රූප කොටස් අතුරෙන් කුමන කොටස් දෙක යොදා ගත හැකි ද?




A B C D

(1) A සහ C (2) B සහ D (3) A සහ D


✪ **අංක 3 සහ 4 ප්‍රශ්නවල කොටුව තුළ ඇති කණ්ඩායම ඇතුළත් කිරීමට වඩාත් ගැළපෙන රූපය කුමක් ද?**

03.




(1) (2) (3)

04.



(1) (2) (3)

05. A රූපයට සමාන රූපයක් ලබා ගැනීමට B රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කීය ද?



A රූපය B රූපය

(1) 3
(2) 4
(3) 5


විභාග අංකය : .....

06. පහත සඳහන් කවියේ අදහස හොඳින් ගැළපිය හැක්කේ,


දත් තිබුණත් කටක්	නැතේ	(1) කෝප්පය
බඩගාමින් ගමන්	යතේ	(2) පනාව
අවුල් වියවුල් දුරු	කෙරෙතේ	(3) කන්නාඩිය
ලස්සන මට ලබා	දෙතේ	

✪ **අංක 7 සහ 8 ප්‍රශ්නවල දැක්වෙන සංඛ්‍යා රටාව තේරුම් ගෙන හිස්තැනට ආ යුතු සංඛ්‍යාව තෝරන්න.**

07.



08.



(1) 6
(2) 8
(3) 9

✪ **වට්ටි 5 ක පිළිවෙළින් අඹ, ඇපල්, දොඩම්, මිදි සහ කෙසෙල් දමා ඇත. ඒ අනුව අංක 9 සහ 10 ප්‍රශ්නවලට අදාළ නිවැරදි පිළිතුරු තෝරන්න.**

★ පළමුව අඹ සහ දොඩම් වට්ටි දෙක මාරු කරන ලදී.

★ දෙවනුව ඇපල් සහ කෙසෙල් වට්ටි දෙක මාරු කරන ලදී.

★ අඹ සහ මිදි ස්ථාන මාරු කරන ලදී.

09. දැන් මැද ඇති වට්ටිය කුමක් ද?

(1) දොඩම් (2) කෙසෙල් (3) මිදි


10. අවසානයට ඇති පලතුරු වට්ටිය කුමක් ද?

(1) කෙසෙල් (2) ඇපල් (3) අඹ

11. සරඹ සංදර්ශනයකට සහභාගී වී සිටි ළමුන් 40 දෙනෙකු එක අවස්ථාවක පෙළ ගැසී සිටියේ සමචතුරස්‍රාකාර හැඩයට ය. එම හැඩයට සකස් වීමේ දී එක පැත්තක සිට බැලූ විට පෙනෙන ළමුන් ගණන කීය ද?

(1) 9 (2) 10 (3) 11

12. රූපයේ දැක්වෙන හැඩය ඇති කඩදාසියක් පළමුවෙන් කඩඉරි දිගේ දෙකට නවා ඉන්පසු පැති දෙක ම හසුවන සේ තිත් ඉරි දිගේ කැපූ විට ලැබෙන ත්‍රිකෝණ ගණන හා චතුරස්‍ර ගණන පිළිවෙළින්,



(1) ත්‍රිකෝණ 3, චතුරස්‍ර 1 (2) ත්‍රිකෝණ 4, චතුරස්‍ර 0

(3) ත්‍රිකෝණ 2, චතුරස්‍ර 2

13.

සීනි 2kg	=	පරිප්පු 1kg
පරිප්පු 3kg	=	තේ කොළ 1kg වේ.

මෙහි දැක්වෙන මිල ගණන්වලට අදාළව සුමනා, නයනා හා කාංචනා යන අය බඩු මලු මිලට ගන්නා ලදී.

සුමනා	නයනා	කාංචනා
සීනි 3kg, පරිප්පු 1kg තේ කොළ 2kg	සීනි 2kg, පරිප්පු 3kg තේ කොළ 1kg	සීනි 3kg, පරිප්පු 2kg තේ කොළ 2kg

වැඩි ම සහ අඩු ම වටිනාකමක් ඇති බඩු මලු මිලට ගත් අය පිළිවෙළින්,

(1) සුමනා සහ නයනා (2) සුමනා සහ කාංචනා

(3) කාංචනා සහ නයනා

14. පෙට්ටියක නිල් පෑන් 6 ක් ද, රතු පෑන් 2 ක් ද, කළු පෑන් 3 ක් ද ඇත. ඒ දෙස නොබලා ඉවතට ගන්නා මුල් ම පෑන සම්බන්ධයෙන් පහත සඳහන් කුමන ප්‍රකාශය වඩාත් නිවැරදි වේ ද?

(1) එය අනිවාර්යෙන්ම නිල් පෑනකි.


(2) එය අනිවාර්යෙන්ම නිල් හෝ කළු පෑනක් විය යුතු ය.

(3) එය නිල් පෑනක් වීමට වැඩි ඉඩක් ඇත.

15. දමිත් A නම් ස්ථානයේ සිට මීටර 100 ක් දකුණු දිශාවට ගමන් කර තම දකුණු අත දෙසට හැරී මීටර 50 ක් ගමන් කර නැවතත් තම වම් අත දෙසට හැරී මීටර 20 ක් ගොස් නැවතත් වම් අත දෙසට හැරී මීටර 50 ක් ගමන් කර B නම් ස්ථානයේ නතර විය. ඔහුගේ මාර්ගය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1)


(2)



(3)


16. පැන්සලක මිල රුපියල් 25.00 කි. පොතක මිල රුපියල් 40.00 කි. පැන්සල් හා පොත් යන දෙවර්ගයෙන් ම කිසියම් ප්‍රමාණයක් කසුන් මිල දී ගත්හ. ඒ සඳහා ඔහුට වැය වූ මුදල රුපියල් 210.00 ක් විය. ඒ අනුව ඔහු මිල දී ගත් පොත් ගණන විය හැක්කේ,

(1) 5 (2) 4 (3) 2

17. එක්තරා ගමක සිටි ජනගහනය ජන සංයුතිය අනුව මෙසේ ය. මුස්ලිම් හා දමිළ ජනගහනය සමාන ය. මුස්ලිම් හා දමිළ ජනගහනය මෙන් දෙගුණයක් සිංහල ජනගහනයකි. මුස්ලිම් හෝ දමිළ ජනගහනයෙන් අඩක් වෙනත් ජාතීන් ද ජීවත් වෙති. එම තොරතුරු ප්‍රමාණාත්මකව දක්වා ඇති අවස්ථාව වන්නේ,

(1) 

(2) 

(3) 

18. මීටර 1000 දුර දිවීමේ ධාවන තරඟයක දී තරඟකරුවන් දිව ගිය ආකාරය මෙසේ ය.

A - අංක 26 දරණ ක්‍රීඩකයාට ඉදිරියෙන් ක්‍රීඩකයන් 4 ක් විය.

B - අංක 14 දරණ ක්‍රීඩකයා දෙවැනි ස්ථානයේ ගමන් ගත්හ.

C - තෙවැනි ස්ථානය දරණ ක්‍රීඩකයාට පසුපසින් ක්‍රීඩකයන් 6 දෙනෙක් විය.

ඉහත තොරතුරු අනුව තරගයට සහභාගී වූ ක්‍රීඩකයන් සංඛ්‍යාව තීරණ කිරීමට,


(1) A සහ B පමණක් ප්‍රමාණවත් වේ. (2) A සහ C පමණක් ප්‍රමාණවත් වේ.

(3) A, B සහ C යන තුන ම අවශ්‍ය වේ.

19. එක්තරා ඔරලෝසුවක වේලාව පැයකට මිනිත්තු 4 බැගින් වැඩියෙන් ගමන් කරයි. මෙම ඔරලෝසුවේ නිවැරදි වේලාව පෙරවරු 10.00 ට නිවැරදිව සකස් කරන ලදී. ඒ අනුව නිවැරදි වේලාව එදින රාත්‍රී 10.00 වන විට මෙම ඔරලෝසුවේ වේලාව කීය ද?

(1) ප. ව. 10.44 (2) ප. ව. 10.48 (3) ප. ව. 10.52

20. පහත රූප සටහනේ ඇති හැඩතල ඇසුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.



(1) ඉහත හැඩතල ඇසුරින් ඝනවස්තු දෙකක් පමණක් සෑදිය හැකි ය.

(2) ඉහත හැඩතල ඇසුරින් ඝනකය, ඝනකාභය සිලින්ඩරය හා චතුස්තලය සෑදිය හැකි ය.

(3) ඉහත ඝනවස්තුවලින් එකවර ඝනකය, සිලින්ඩරය සහ චතුස්තලය පමණක් සෑදිය හැකි ය.

21. P යනු Q ගේ ස්වාමිපුරුෂයා ය. Q යනු R ගේ දුව ය. R ගේ බිරිඳ S වේ. S ගේ සහෝදරිය T වේ. එසේ නම් නිවැරදි පිළිතුර තෝරන්න.

(1) Q ගේ තාත්තා S විය හැක. (2) Q ගේ පුංචි අම්මා T විය හැක.

(3) P ගැහැනු කෙනෙක් විය හැක.

22. රතු පාට වට්ටියේ අරලිය මල් දහ හතරක් ද කොළ පාට වට්ටියේ අරලිය මල් දහයක් ද දමා තිබේ. කොළ පාට වට්ටියෙන් අරලිය මල් හරි අඩක් රතු පාට වට්ටියට දැමූ අතර රතු පාට වට්ටියෙන් නැවත අරලිය මලක් කොළ පාට වට්ටියට දමන ලදී. දැන් කොළ පාට වට්ටියේ ඇති අරලිය මල් මෙන් කී ගුණයක් රතු පාට වට්ටියේ තිබේ ද?

(1) දෙගුණයක් (2) සිවුගුණයක් (3) තුන්ගුණයක්

❒ ටොෆී පෙට්ටි පහක් එක උඩ තබා ඇති ආකාරය මෙසේ විස්තර වේ. සියඹලා ටොෆී පෙට්ටිය තිබුණේ උඩින් ම හෝ යටින් ම නොවේ. අඹ ටොෆී පෙට්ටිය දොඩම් ටොෆී පෙට්ටියට උඩින් තිබුණි. සියඹලා ටොෆී හා ස්ටෝබෙරි පෙට්ටි දොඩම් ටොෆී පෙට්ටියට පහළින් තිබුණි. නාරං ටොෆී පෙට්ටිය අඹ ටොෆී පෙට්ටියට පහළින් විය.


23. ඉහත විස්තරයට අනුව උඩින් ම තිබුණේ කුමන පෙට්ටිය ද?

(1) අඹ (2) සියඹලා (3) දොඩම්

24. හරි මැදින් තිබුණේ කුමන පෙට්ටිය ද?

(1) ස්ටෝබෙරි (2) නාරං (3) දොඩම්

25. රූපයේ දැක්වෙන්නේ ලීවලින් සාදන ලද ඝනවස්තුවකි. එය තිත් ඉරි දිගේ කැපූ විට කැපුම් මුහුණතේ හැඩය වන්නේ,




(1) ත්‍රිකෝණයකි. (2) සමචතුරස්‍රයකි.

(3) ඍජුකෝණාස්‍රයකි.

26. සුනිල්ගේ වැටුප මෙන් යෂාන් දෙගුණයක වැටුප් ලබයි. අඩු ම වැටුප ලබන්නේ කුෂාන් ය. සුනිල් සහ සමන් සමාන වැටුපක් ලබයි. බිසඳුගේ වැටුප සුනිල් සහ කුෂාන්ගේ වැටුප්වල එකතුවට සමානයි. මේ අනුව වැඩි ම වැටුපක් ලබන කෙනා කවු ද?

(1) යෂාන් (2) බිසඳු (3) සුනිල්

❒ පහත සඳහන් ඝනකයේ 1, 2, 3, 4, 5 සහ 6 ලෙස අංක ලියා තිබේ. අංක 1 ට විරුද්ධ පැත්තේ අංක 4 ද, අංක 3 ට විරුද්ධ පැත්තේ අංක 5 ද ලකුණු කර ඇත.



27. මෙම ඝනකය A දිශාවට දෙවරක් පෙරළුවොත් උඩ පැත්තට මතුවන අංකය කුමක් ද?

(1) 4 (2) 5 (3) 6


28. මුල් පිහිටීමේ සිට මෙම ඝනකය B දිශාවට දෙවරක් පෙරළුවොත් අපට පෙනෙන්නට තිබෙන අංක තුන කුමක් ද?

(1) 1, 4, 3 (2) 2, 3, 1 (3) 6, 4, 3

29. කඩයක ඇති පඩි තුනක බර 16kg කි. එම පඩි තුනම හෝ කිහිපයක් පාවිච්චි කර 11kg සහ 12kg යන බරවල් කිරා ගත හැකිය. එහි එක් පඩියක් 9kg නම් අනෙක් පඩි දෙක විය හැක්කේ,

(1) 5, 2 (2) 3, 4 (3) 6, 1

30. රූපයේ දක්වා ඇත්තේ කුඩා ඝනක යොදා ගෙන කරනු ලැබූ විශාල ඝනකයක ඇටවුමකි. එහි අඳුරු කර ඇති ඝනක කැට නිරූපිත මුහුණේ සිට ඊට විරුද්ධ මුහුණත තෙක්ම ගලවා ඉවත් කර ඇති අතර එම නිසා ඝනකය තුළ කුහර නිර්මාණය වී ඇත. ඒ අනුව මෙහි ඇති කුඩා ඝනක ගණන කීය ද?



(1) 50

(2) 52

(3) 48

31. දුම්රියක් 45 වෙනි කිලෝමීටර කණුවේ සිට 50 වෙනි කිලෝමීටර කණුව පසු කිරීමට මිනිත්තු 10 ක්ගත කර තිබුණි. දුම්රිය එම වේගයෙන් ම ගමන් කළහොත් 80 වෙනි කිලෝමීටර කණුව පසු කිරීමට තවත් මිනිත්තු කීයක් ගත වේ ද?

(1) මිනිත්තු 45 (2) මිනිත්තු 30 (3) මිනිත්තු 60


32. නාලක අතේ පලතුරු වර්ග තුනක් තිබුණි. ඔහු අත ඇති ඇපල් ගෙඩි ගණන 8 කි. ඉතුරු පලතුරුවලින් 1/3 ක් දොඩම් වේ. ඉතුරු පලතුරු අඹ වේ. එම පලතුරු ගණන 12 කි. නාලක අත තිබූ මුළු පලතුරු ගණන කීය ද?

(1) 24 (2) 26 (3) 28

33. කුඩයක ප්‍රමාණයෙන් හා හැඩයෙන් සමාන බෝල 6 ක් ඇත. මෙම සියලුම බෝල 40g ක් බර බව කියයි. නමුත් එක් බෝලයක් 40g ට අඩු ය. තැටි තරාදියක් භාවිතයෙන් පඩි නොමැති ව බර අඩු බෝලය සොයා ගැනීමට තරාදිය භාවිතා කළ යුතු අවම වාර ගණන කීය ද?

(1) 2 කි. (2) 3 කි. (3) 4 කි.

34. පහත සඳහන් කොටුව තුළ නාලක, නිසර, ගගන සහ පහන් සිටගෙන සිටිති. එහි උතුරු දිශාව ලකුණු කර ඇත. නිසර සහ පහන් නැගෙනහිර දිශාවට මුහුණ ලා සිටිති. නාලක සහ ගගන බස්නාහිර දිශාවට මුහුණ ලා සිටිති. මේ අය අතුරෙන් මුහුණට මුහුණ ලා සිටින දෙදෙනා කවුද?



(1) පහන් සහ ගගන

(2) නිසර සහ පහන්

(3) නාලක සහ නිසර

35. නගරයක් අදියර දෙකකින් සංවර්ධනය කිරීමට සැලැසුම් කොට තිබුණි. පළමු අදියර සඳහා මාස 10 ක් ද දෙවන අදියර සඳහා මාස 18 ක් ද ගත වේ. නගරයේ සංවර්ධන කටයුතු 2026 ජනවාරි මාසයේ ආරම්භ කරන ලදී. එසේ නම් නගරය සංවර්ධනය කොට අවසන් කළ හැක්කේ,

(1) 2027 (2) 2028 (3) 2029

36. තරුෂි සහ කාංචනා වෘත්තාකාර ධාවන පථයක තරග දිවීම ආරම්භ කළහ. කාංචනා වට භාගයක දුර යන විට තරුෂි වටයක් සම්පූර්ණ කර ඉදිරියට පැමිණෙමින් කාංචනාව පසු කළා ය. ඒ අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ.

(1) තරුෂිගේ වේගය කාංචනාගේ වේගය මෙන් තුන්ගුණයකි.

(2) තරුෂිගේ වේගය කාංචනාගේ වේගය මෙන් දෙගුණයකි.

(3) කාංචනාගේ වේගය තරුෂිගේ වේගය මෙන් තුන්ගුණයකි.

37. A, B, C, D නමින් කම්බි 4 කි. කම්බි 4 ම සමාන පරතර තබා පිළිවෙළින් 2, 3, 4, 5 බැගින් කැපුම් යෙදූ විට එක් කොටසක දිග පිළිවෙළින් 10cm, 8cm, 9cm සහ 7cm විය. ඒ අනුව කැපීමට පෙර තිබූ කම්බිවල දිග ප්‍රමාණයන් ආරෝහණ පිළිවෙළට පෙළ ගැස්වූ විට,

(1) ABCD (2) ABDC (3) BADC

38.

10	20	30
60	50	40
70	80	90

රූපයේ දැක්වෙන කොටු දැල එක් කොටසකට සංඛ්‍යා තුන බැගින් වන පරිදි කොටස් තුනකට කපා වෙන් කළ විට එක් කොටසක අඩංගු වූ සංඛ්‍යාවල එකතුව 120 කි. අනෙක් කොටස් දෙකෙහි අඩංගු සංඛ්‍යාවල එකතුව වෙන වෙන ම ගත් විට පිළිතුර තෝරන්න.

(1) 200 හා 130


(2) 210 සහ 120

(3) 90 සහ 240

39. ළමයි කණ්ඩායමකට තෑගි ලෙස පැන්සල් සහ පොත් ලබා දීමට එක්තරා ආයතනයක් පියවර ගන්නා ලදී. මෙහි දී පැන්සල් 160 ක් ද, පොත් 240 ක් ද ලබා දුන් අතර සෑම දරුවෙකුට ම මේ දෙවර්ගයෙන් ම සමානව ලැබෙන සේ මේ ද්‍රව්‍ය දෙක ම බෙදා දුන් අතර මේ වර්ග දෙක ම ඉතුරු වූයේ ද නැත. එසේ නම් මේ වර්ග දෙක ම බෙදා දිය හැකි උපරිම ළමයි සංඛ්‍යාව කීය ද?

(1) 20 (2) 30 (3) 40

40. පහත රූපය භාවිත කර බලන්න. එය කඩදාසි දිගේ සමාන කොටස් හතරකට වෙන් කරන ලදී. එම රූපය සමාන කොටස් හතරකට වෙන් කිරීමට පෙර එහි තිබූ රූපයේ මුළු දිග සහ කොටස් හතරකට වෙන් කළ පසු එම කොටස් හතරෙහි වටේ දිග අතර වෙනස කීයක් විය හැකි ද?



(1) 16cm

(2) 12cm

(3) 18cm

සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

ප්‍රශ්න පත්‍ර අංක 03

II පත්‍රය

කාලය පැය 01 යි මිනිත්තු 15 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවල **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම් කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව සහතික කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය.	V/II/S/CH

ලබා දෙන දිනය - 2026.. පෙ.ව. 9.30 සිට පෙ.ව. 10.45 දෙවැනි පිටුව බලන්න.

01. පහත දැක්වෙන ඡේදය කියවන්න. ඡේදය ඇසුරින් පිළිතුරු ලියන්න.

පිඹුරුයාය ගමේ වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ ගොවිතැන ය. ඒ නිසා ම සෑම නිවසක ම පාහේ විවිධ සතුන් ඇති කිරීම ද සිදු කෙරේ. සිරිසෝමගේ ගෙදර සිටින කුකුළා උදෑසනින් ම අවදි වී කුක්කු කු..... යැයි හඬ නඟයි. එවිට ම තවත් කුකුළෙක් හඬලන හඬ ඇතින් ඇසෙයි. එළදෙන උම්බෑ හඬ නඟන විට තවත් එළදෙනක් හඬ නඟයි. කුරුල්ලාගේ කිචි බිචි නාදය දසතින් ම ඇසෙයි.

(i) ඡේදයේ සඳහන් ගම කුමක් ද? .....

(ii) එම ගමේ වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය කුමක් ද? .....

(iii) ඡේදයේ සඳහන් සතුන්ගේ හඬවල් දෙකක් ලියන්න.

.....

(iv) ඡේදයේ ඉරි ඇඳි වැකිය අතීතකාලයට හරවා ලියන්න.

.....

(v) සෑම නිවසක ම සිදු කරන දෙයක් ඡේදයේ සඳහන් කර ඇත. එය කුමක් ද?

.....

(vi) ඡේදයේ සඳහන් සඤ්ඤක අක්ෂරයක් ලියන්න. .....

(vii) දසතින් ම ඇසෙන්නේ කුමක් ද? .....

02. පහත සඳහන් එක් එක් වගන්තියට ගැළපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

(i) අපි කිසි විටෙක බොරු ..... (නොකියමි / නොකියමු)

(ii) ඔවුහු අධ්‍යාපන චාරිකාවට සහභාගී ..... (වූහ / වෙයි)

(iii) ඔහු ළමා කවි ගායනා ..... (කළා ය / කළේ ය)

(iv) කරත්ත පෙළ පාරේ ගමන් ..... (කරයි / කරති)

(v) මිහිරි ද රුවනි ද නිවැරදිව අකුරු ..... (ලියයි / ලියති)

03. පහත දැක්වෙන වගන්තියෙහි අදාළ ස්ථානවල සුදුසු විරාම ලකුණු යොදන්න.

අර තනි කකුලෙ මේසයක් කවිෂා කීවා ය

04. පහත වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

සෙනසුරාදා / ම / සිසුහු / අසල / යති / පිටිටනියට / සෑම / නිවස / දවසක

.....

05. අක්ෂර වින්‍යාසය අනුව නිවැරදි වචනය තෝරන්න.

(i) බරපතළ පිළිවෙල වළාකුල වර්දනය

(ii) විශිෂ්ඨ පොළිස් පොළව කොට්ඨාසය

විභාග අංකය : .....

06. පහත ඉඟි වැකියට ගැළපෙන අදහස ලියන්න.

අහසේ මාළිගා

.....

07. පහත සඳහන් ප්‍රස්තා පිරුළෙහි අදහස ලියන්න.

රයිගමයයි ගම්පළයයි වගේ.

.....

08. පහත වාක්‍යයෙහි උපමාව යටින් ඉරක් අඳින්න.

බැස යන හිරු රත් පැහැ ගැන්වුණු ගිනි බෝලයක් මෙන් දිස් වේ.

09. පහත වාක්‍ය ලිඛිත බසට හරවා ලියන්න.

කිරිල්ලිය ඉහළ අහසේ පියාසර කළා. - .....

10. පහත සඳහන් වාක්‍යයෙහි යුගල පද සම්පූර්ණ කරන්න.

..... පහල පුංචි ළමයි කෙළි ..... කිරීමට කැමැත්තක් දක්වති.

11. පහත සඳහන් වචනවල අදහස ලියන්න.

1. කලල් කර ගන්ඩ. - .....
2. නුනුවණකමෙක් - .....

(ලකුණු 24)

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.

(i) 

(ii) 

13. එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

(i) Clouds - ..... (ii) Ekel broom - .....

14. පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) am / watering / I / plants / the

.....

(ii) We / playground? / shall / to / go / the

.....

15. "ඔන්බදු මණි" යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

.....

16. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහල භාෂාවෙන් ලියන්න.

මට මල්ලි කෙනෙක් ඉන්නවා. - .....

(ලකුණු 8)

17. (i) පහත සඳහන් සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.

28 945 - .....


(ii) 'අසූ දහස් නවය' සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න. .....

18. (6) 7 3 5 4 රවුම් කළ සංඛ්‍යාවේ ස්ථානය සහ ස්ථානීය අගය ලියන්න.

(i) ස්ථානය - ..... (ii) ස්ථානීය අගය - .....

19. 39 678, 39 876, 39 768 යන සංඛ්‍යා තුන ආරෝහණ පිළිවෙළට ලියන්න.

.....

20. 

(i) මෙම රූපයේ 0.4 ක් අඳුරු කර දක්වන්න.

(ii) රූපයේ අඳුරු නොකළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න. .....

(iii) වට්ටියක ඉද්ද මල් 52 ක් තිබූ අතර එයින් 3/4 ක් පර වී තිබුණි. ඉතුරු මල් ප්‍රමාණය කොපමණ ද? .....

21. 

3l 550ml *2l 270ml*

පහත A හා B භාජන දෙකේ ජලය පුරවා ඇත. එහි ඇති ජල ප්‍රමාණ පහත දැක්වේ. භාජන දෙකේ ම ජල ප්‍රමාණ සමාන වීමට A භාජනයෙන් B භාජනයට දැමිය යුතු ජල ප්‍රමාණය කොපමණ ද? .....

22. මල්ලක පරිප්පු 14kg ක් තිබුණි. එයින් 7kg 650g ක් විකිණූ අතර ඉතුරු පරිප්පු ප්‍රමාණය කොපමණ ද? .....

23. 

මෙහි සඳහන් ඝනවස්තුවේ,

(i) නම - ..... (ii) මුහුණත් - .....

24. (i) පහත බිල්පත සම්පූර්ණ කරන්න.

ද්‍රව්‍යය	1kg ක මිල		ප්‍රමාණය	වටිනාකම	
	රුපියල්	සත		රුපියල්	සත
පරිප්පු	(i)	.....	2kg	550	00
කරවල	880	00	(ii)	220	00
කඩල	350	00	200g	(iii)	.....
			මුළු මුදල	(iv)	.....

(ii) ඉහත බිල්පත සඳහා රුපියල් 1000 ක මුදලක් ලබා දුන්නේ නම් ලැබෙන ඉතුරු මුදල කීය ද? .....

25. 12m ක් දිග කම්බියකින් 4m 5cm ක් කපා ඉවත් කරන ලදී. ඉතුරු ප්‍රමාණය කොපමණ ද?

.....

26. පොත් 726 ක් එක් ළමයෙකුට පොත් 6 බැගින් බෙදා දෙන ලදී. ළමයි කී දෙනෙකුට පොත් බෙදා දුන්නේ ද? .....

27. නුවන් කොළඹ යෑමට නිවසින් පස්වරු 12.30 ට පිටත් වූ අතර ඔහු කොළඹට පස්වරු 5.20 ට ළඟා විය.

(i) නුවන් කොළඹට ළඟා වූ වේලාව පැය 24 ඔරලෝසු වේලාවෙන් ලියන්න.

.....

(ii) ඔහුට කොළඹට යෑමට ගත වූ කාලය කොපමණ ද? .....

28.


දුම්රිය	පැමිණි මගීන් සංඛ්‍යාව
උඩරට මැණිකේ	3510
රුහුණු කුමාරි	2898
පොඩි මැණිකේ	1872

මෙම වගුව ඇසුරින් පිළිතුරු ලියන්න.

(i) උඩරට මැණිකේ සහ රුහුණු කුමාරි දුම්රිය දෙකෙන් පැමිණි මුළු මගීන් සංඛ්‍යාව කීය ද? .....

(ii) පොඩි මැණිකේ දුම්රියට වඩා උඩරට මැණිකේ දුම්රියෙහි පැමිණි මගීන් සංඛ්‍යාව කොපමණ ද? .....

29.



පැයක් තුළ මාර්ගයක ධාවනය වූ වාහන පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයේ දැක්වේ.

(i) ඒ මොහොතේ මාර්ගයේ ධාවනය වූ ලොරි ප්‍රමාණය 8 කි. එය ප්‍රස්තාරයේ අඳුරු කර දක්වන්න.

(ii) පැයක් තුළ මාර්ගයේ ධාවනය වූ මුළු වාහන ගණන කීය ද? .....

(ලකුණු 30)

❖ අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න.**

30. සූර්ය නමස්කාරය කිරීමේ වාසි තමාට ලැබීමට නම්,

1. යෙදෙන සමස්ත කණ්ඩායම නිවැරදිව සූර්ය නමස්කාරයේ යෙදිය යුතු ය.
2. තමා නිවැරදිව එක සිතුවිල්ලෙන් සූර්ය නමස්කාර ක්‍රියාවේ යෙදිය යුතු ය.
3. සූර්ය නමස්කාරයට මග පෙන්වන ගුරුතුමා හෝ ගුරුතුමිය යෙදෙන ආකාරය මැනවින් නිරීක්ෂණය කළ යුතු ය.

31. මී කිරි, කස්තුරි, ගිතෙල් ලබා දෙන සතුන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. මී ගවයා, ගෝනා, එළුවා
2. මී මැස්සා, මුවා, ගවයා
3. අම්බරුවා, මුවා, එළදෙන

32. පෙති හතරක් ඇති මලකට උදාහරණයකි.

1. ඉද්ද 2. සමන්පිච්ච 3. රත්මල්

33. සීයාට උණුසුම් පානයක් ආච්චිට සිසිල් බීම වර්ගයක් ද ඉල්ලයි. ඒ සඳහා යොදා ගත හැකි පිළිතුර පිළිවෙළින්,


1. කොමඩු, පිපිඤ්ඤා 2. රණවරා, ගස්ලබු 3. බෙලිමල්, රණවරා

34. ජාතික කොඩියේ වර්ණ සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. බෝපත් කොළ පාට වන අතර සිංහයා කහ පාට ය.
2. බෝපත් හා සිංහයා කහ පාට ය.
3. සිංහයා කහ පාට වන අතර සිංහයා වටා කොළ පාට පසුබිමක් ඇත.

35. සෙක්කුව භාවිත කරන්නේ පහත සඳහන් කුමන කාර්යය සඳහා ද?

1. සී සෑම 2. පිටි කෙටීමට 3. තෙල් සිඳීමට

36. 

පහත පරීක්ෂණය සිදු කිරීම තුළින් සිදු නොවන දේ මින් කුමක් ද?

1. ජලය වාෂ්ප වීම.
2. ජලය රත් වීම.
3. පිත්තල හැන්ද පුපුරා යාම.

37. තුන්පැත්තක් මුහුදෙන් වට වී ඇති පළාතකි.

1. දකුණු පළාත 2. නැගෙනහිර පළාත 3. උතුරු පළාත

38. සුළු පිළිස්සීමක දී භාවිත කරන ඖෂධීය ශාකයකි.

1. පාවට්ටා 2. කෝමාරිකා 3. ගොනිකා

39. කොළඹ සිට බදුල්ල දක්වා වැටී ඇති දුම්රිය මාර්ගයේ හමුවන දුම්රිය නැවතුම්පොළකි.


1. වටවල 2. හබරණ 3. මීගමුව

40. ලේන්සුවක මල, නටුව සහ පත්‍ර මැසීම සඳහා භාවිතා කළ හැකි විසිතුරු මැහුම් ක්‍රමය වන්නේ,

1. බ්ලැන්කට් මැස්ම 2. කතිර මැස්ම 3. දම්වැල් මැස්ම

41. මින්නේරිය වැව සහ අභය වැව සෑදූ රජවරුන් පිළිවෙළින්,

1. ධාතුසේන රජු හා පණ්ඩුකාභය රජු 2. මහසෙන් රජු හා පණ්ඩුකාභය රජු
3. පණ්ඩුකාභය රජු හා මහසෙන් රජු

42. 

මෙම ඇටවුමට චුම්බක ශක්තිය වැඩි කිරීමට කළ හැකි දෙයකි.

1. වියළි කෝෂ ගණන අඩු කිරීම.
2. කොයිල් කම්බි ඔතන ප්‍රමාණය වැඩි කිරීම.
3. කොයිල් කම්බි ඔතන ප්‍රමාණය අඩු කිරීම.

43. ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පිහිටා ඇත්තේ,

1. මත්තල 2. කටුනායක 3. රත්මලාන

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -


44. ශරීරයේ ශක්තිය හීන වීම සහ ශරීරයේ පිරිපුන් බව හීන වීම සිදු වන්නේ,

1. විටමින් සහ ප්‍රෝටීන් පෝෂ්‍ය පදාර්ථ හීනවීම.
2. කාබෝහයිඩ්‍රේට් සහ මේදය පෝෂ්‍ය පදාර්ථ හීනවීම.
3. මේදය සහ ප්‍රෝටීන් පෝෂ්‍ය පදාර්ථ හීනවීම.

45. අත් ආවරණ හා පා ආවරණ පලඳින්නේ පහත සඳහන් කුමන ක්‍රීඩාව සඳහා ද?

1. එල්ලේ 2. ක්‍රිකට් 3. අත්පන්දු

46. දැල්වෙන බල්බය තෝරන්න.

1. 

2. 

3. 

47. ලී කැටයම් සහ රූකඩ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන නගර පිළිවෙළින්,

1. පිළිමතලාව සහ අම්බලන්තොට
2. ඇම්බැක්ක සහ අම්බලන්ගොඩ
3. කඩුගන්නාව සහ අම්බලන්ගොඩ

48. ළමයෙකු වීදුරු බඳුනක් ගෙන අකුණු ගසන වේලාවක පිට්ටනිය හරහා දුවයි.


1. ඔහු අනාරක්ෂිත අවස්ථා දෙකකට මුහුණ දී සිටියි.
2. එහි අනාරක්ෂිත ස්ථානයක් හා අනාරක්ෂිත අවස්ථාවක් සඳහන් වේ.
3. ළමයා අනාරක්ෂිත ස්ථාන දෙකකට ළං වී ඇත.

49. වැඩ පහසු කිරීමේ යන්ත්‍රයට අදාළ ව එය ක්‍රියා කරවන ආකාරය නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. විල්බැරෝව - ඇදීම. 2. ගිරය - කැපීම. 3. කප්පිය - තල්ලු කිරීම.

50. සිදුරු කැමරාවක තිරය සෑදීමට යොදා ගන්නේ,

1. වර්ණ කඩදාසි 2. සුදු ටිෂූ කඩදාසි
3. සුදු කාඩ්බෝඩ් කැබැල්ලක්

51. 

මෙහි පොල්තෙල් තට්ටුවක් දැමීමෙන් බලාපොරොත්තු වන්නේ,

1. වාතය ඇතුළු කරවීමට
2. වාතය ඇතුළු වීම වැළැක්වීමට
3. ජලය සිසිල් කිරීමට

52. තොරතුරු සජීව ලෙස ද අපට ලබා දෙන මාධ්‍යයක් නොවන්නේ,

1. දැන්වීම 2. ගුවන් විදුලිය 3. රූපවාහිනිය

53. ශ්‍රී ලංකාවේ උස ම දියඇල්ල වන්නේ,

1. ලක්ෂපාන 2. බඹරකන්ද 3. දුන්හිඳ

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අංශයේ ප්‍රකාශනයකි. -

54. ජාතික ගීය හා ජාතික කොඩිය සම්පාදන කමිටුවේ ක්‍රියාකාරී සාමාජිකයෙකු වූයේ,

1. ආචාර්ය ටී. බී. ජයා මැතිතුමා
2. ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා
3. ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මැතිතුමා

55. බෝග වගාවට හිතකර සතුන් වන්නේ,

1. කුරුමිණියා, දළඹුවා, කීඩෑවා
2. කටුස්සා, පිටිමකුණා, පුරුක් පණුවා
3. මී මැස්සා, බඹරා, සමනලයා


56. පදිකයින් පාර මාරු වීම සඳහා වන සංඥා පුවරුවේ රතු මිනිසා දැල්වූ විට,

1. පාර හරහා මාරු වීම කළ යුතු ය.
2. පාර හරහා මාරු වීම නොකළ යුතු ය.
3. පාර හරහා මාරු වීමට සූදානම් විය යුතු ය.

57. හොඳින් මේරූ බීජයක් හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?

1. ජල භාජනයකට දමන බීජ පතුලට බැසීම.
2. බීජයේ තැනින් තැන පුල්ලි සහිත වීම.
3. බීජයේ වර්ණය තද පැහැ නොගැනීම.

58. අතට දැනෙන බර අඩු කර ගැනීමට විල් බැරෝවේ භාණ්ඩ තබා ඇති නිවැරදි රූපය වන්නේ,

1. 
2. 
3. 

59. ඒක දේශික සතුන් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. වලිකුකුළා, මල්පුලුට්ටා, දියනයා
2. වලිකුකුළා, හබන් කුකුළා, වලහා
3. කලවැද්දා, ගිරවා, හික්මියා

(ලකුණු 30)

60. හිමිදිරියේ ම වැහි ඇදිරිය අහස පුරා වසා තිබුණි. කුෂාන්ගේ පාසල් ගමනට එය බාධාවක් නොවී ය. පොත් බෑගය තුරුළු කරගත් ඔහු පාසල් යාමට පිටත් ව ගියේ ය. එක්වරම මහ වැස්සක් ඇද හැලුණි.... කුෂාන් ඔබ යැයි සිතා මින් ඉදිරියට සිදුවිය හැකි දේ නිර්මාණාත්මක වැකි 3ක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. .....

.....

2. .....

.....

3. .....

.....

(ලකුණු 6)



සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2026

5 ශ්‍රේණිය



ප්‍රශ්න පත්‍ර අංක 03

I පත්‍රය - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුර
01	(3)
02	(2)
03	(2)
04	(3)
05	(1)
06	(2)
07	(2)
08	(3)
09	(3)
10	(2)
11	(3)
12	(2)
13	(3)
14	(3)
15	(1)
16	(2)
17	(2)
18	(2)
19	(2)
20	(3)

ප්‍රශ්න අංකය	පිළිතුර
21	(2)
22	(3)
23	(1)
24	(3)
25	(3)
26	(1)
27	(1)
28	(3)
29	(1)
30	(2)
31	(3)
32	(2)
33	(1)
34	(1)
35	(2)
36	(1)
37	(2)
38	(3)
39	(3)
40	(2)

- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි. -